## 1.20 පොළොන්නරු යුගයේ ශිව ශාන්තුවර මූර්ති

අංජලී වික්‍රමසිංහ
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

දේශපාලනික ආර්ථික සාමාජික හා සංස්කෘතික ලක්ෂණ අතින් අනුරාධපුර යුගයට පොදු සාම්‍යයක් පළ කරන නමුදු පොළොන්නරු යුගය, එම යුගයට ම අනන්‍ය ලක්ෂණ රාශියක් ද ප්‍රකට කරයි. දේශපාලනික හා ආගමික ප්‍රතිසංස්කරණ මෙන් ම ද්‍රවිඩ හින්දු, සාමයික සම්පර්කය ද මෙකී අනන්‍යතාව ඇති කිරීමෙහිලා ප්‍රමුඛ සාධකයක් විය. එහෙයින් පොළොන්නරු යුගයේ කලා ශිල්ප සාහිත්‍යය හා ආගම දහම ද අවශේෂ යුගවලට වඩා වෙනස් මුහුණුවරක් ගෙන තිබේ. අනුරාධපුර යුගයේ ශ්‍රද්ධාව හා ප්‍රඥාව මූලික කොටගත් බුදු සමය භක්තිවාදයට නැඹුරුවීම සඳහා තත්කාලීන ව සිදු වූ හින්දු බලපෑම් මූලික විය. එහෙයින් ගෘහ නිර්මාණ, චිත්‍ර, මූර්ති ආදී සෑම කලා මාධ්‍යයක ම මෙකී හින්දු බලපෑම පතිත වී ඇති ආකාරය පොළොන්නරු යුගයේ පුරා විද්‍යාත්මක මූලාශ්‍ර හැදෑරීමේ දී පැහැදිලි වේ.

එබැවින් ප්‍රබල ආගමික සංස්කෘතික විපර්යාසයකට තුඩුදුන් හින්දු-ශිව මූර්ති අතුරෙන් තෝරාගත් නිදර්ශන කීපයක් ඇසුරින් තත්කාලීන මූර්ති කලාවේ විශේෂ ප්‍රවණතා කීපයක් පිළිබඳ විචාර පූර්වක අවධානයක් යොමු කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අභිප්‍රායයි. මෙහිලා

- ශිව ශාන්තුවර අපදාන පිළිබඳ ග්‍රන්ථාගත තොරතුරු හා ජනශ්‍රුති
- ඔවුන්ගේ රූප ලක්ෂණ හා චර්යා ලක්ෂණ
- භක්ති සංකල්පය හා මූර්ති ලක්ෂණ

වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

ශිව ශාන්තුවරයන් අතුරෙන් පහත සඳහන් ශාන්තුවර මූර්ති අපගේ අධ්‍යයනය සඳහා ලක්ෂ්‍ය වේ.

- අප්පර්/ අප්පාර් ස්වාමි
- තිරුඥාන සම්පන්දර් ස්වාමි
- සුන්දර මූර්ති ස්වාමි
- මාණික්කවාචික ස්වාමි
- චණ්ඩිකේශ්වර/සණ්ඩේශ්වර
- කාරෙක්කාල් අම්මයියාර්

මෙහි දී අදාළ මූලාශ්‍ර ග්‍රන්ථ, ජනශ්‍රැති, ඡායාරූප ආදිය ඇසුරු කරගනිමින් අදාළ ප්‍රස්තුතය විග්‍රහ කිරීමට අපේක්ෂිතය.